# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,004 - 2017 ජනවාරි මස 27 වැනි සිකුරාදා - 2017.01.27**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 136 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 138 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 140 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 144 |


*සැ. යු.* - අවලංගු කළ නොහැකි තෑගි ඔප්පු බලවත් අකෘතඥතාවය පදනම් කොටගෙන අවලංගු කිරීමේ පනත් කෙටුම්පත 2017 ජනවාරි මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2017 පෙබරවාරි මස 17 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 පෙබරවාරි මස 03 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*.

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ඉඩම් අමාත්‍යාංශය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**මිල ගණන් කැඳවීමයි**

***ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2017***

වසර දෙකක කාලයක් සඳහා පහත දැක්වෙන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ගොඩනැගිල්ලක් කුලියට ගැනීමට මිල ගණන් 2017.02.17 වැනි දින පස්වරු 2.00 දක්වා අදාළ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී භාරගනු ලැබේ. එදිනම ප. ව. 2.05 ට මිල ගණන් විවෘත කරනු ලැබේ.

| *පළාත* | *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය* | *මිල ගණන් භාර ගැනීම* | *ආසන්න නගරය* | *නිවස අවශ්‍ය දිනය* |
|---|---|---|---|---|---|
| දකුණු පළාත | ගාල්ල | බද්දේගම | පළාත් සර්වේයර් ජනරාල් (දකුණු පළාත), පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලය, ගාල්ල | බද්දේගම අවට | 2017.03.01 |

*සපුරාලිය යුතු පොදු අවශ්‍යතා :*

සෑම ගොඩනැගිල්ලක්ම ආරක්ෂිත වැටකින් හෝ තාප්පයකින් ආරක්ෂා වී තිබිය යුතු ය. ජල නළ පහසුකම් තිබිය යුතු අතර, අප ද්‍රව්‍ය හෝ ජලය ඉවත් කිරීමේ ක්‍රමවත් පද්ධතියක් තිබිය යුතු ය. ජල හා විදුලි මීටර් වෙන වෙන ම තිබිය යුතු ය. යාබදව අධික ශබ්ද නැගෙන කර්මාන්තශාලා හෝ එවැනි වෙනත් දෑ නොතිබිය යුතු ය. ගොඩනැගිල්ල පිහිටා ඇත්තේ ප්‍රධාන මාර්ගයට යාබදව නොවේ නම් ඒ සඳහා ක්‍රමවත් පිවිසුම් මාර්ගයක් තිබිය යුතු ය.

පහත දක්වා ඇති ආකෘතියට අනුව සකසන ලද ඉල්ලුම් පත්‍ර, සපුරාලිය යුතු පොදු අවශ්‍යතා විස්තර ද, සහිතව, ලිපි කවරයේ ඉහල වම් කෙළවරෙහි " ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල කුලියට ගැනීම (අදාළ ස්ථාන නාමය)" යනුවෙන් සඳහන් කර, 2017.02.17 වැනි දින පස්වරු 2.00 ට පෙර ලැබෙන සේ පළාත් සර්වේයර් ජනරාල් කාර්යාලයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනැවිත් භාරදීම කළ හැකිය.

සර්වේයර් ජනරාල්.

2017 ජනවාරි මස 11 වැනි දින,
කොළඹ 05, කිරුල පාර,
සර්වේයර් ජනරාල් කාර්යාලයේ දී ය.

*ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාල සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම - 2017*

**මිල ගණන් කැඳවීමේ ඉල්ලුම්පත්‍රය - 2017**

*ගොඩනැගිලි අයිතිකරුගේ -*

1. සම්පූර්ණ නම : _____________.
2. ලිපිනය : _____________.
3. දුරකථන අංකය : _____________.
4. ජාතික හැඳුනුම්පත් අංකය : _____________.

*ගොඩනැගිල්ල -*

1. කුලියට දෙනු ලබන්නේ කුමන ප්‍රාදේශීය මිනින්දෝරු කාර්යාලය සඳහා ද? : _____________.
2. මාසික කුලී මුදල : _____________.

3. පිහිටි ස්ථානයේ ලිපිනය : ____________.
4. අදාළ නගරයේ සිට පිහිටි ස්ථානයට ඇති දුර ප්‍රමාණය කි. මී. : ____________.
5. භූමියේ විශාලත්වය : ____________.
6. ගොඩනැගිල්ලේ වර්ග අඩි ප්‍රමාණය හා කාමර ගණන ආදිය පිළිබඳව විස්තර: ____________.
7. වෙනම කියවිය හැකි ජල මීටර් තිබේ ද? : ____________.
8. වෙනම කියවිය හැකි විදුලි මීටර් තිබේ ද? : ____________.
9. ආරක්ෂිත මායිම් විස්තර සපයන්න (තාප්පය/කම්බි වැට/...........................) : ____________.
10. නවතා තැබීමට හැකි වාහන ගණන : ____________.

ඉහත තොරතුරු සත්‍ය බවත් යම් තොරතුරක් අසත්‍ය බව හෙළිවුවහොත් මවිසින් ඉදිරිපත් කරනු ලබන මිල ගණන් සර්වේයර් ජනරාල් ප්‍රතික්ෂේප කරනු ලබන බව මම දන්නා බවත් මෙයින් පිළිගනිමි.

____________.
අයදුම්කරුගේ අත්සන.

01-876

---

## මඩකලපුව මහාධිකරණය

### අධිකරණ භාරයට ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද යතුරු පැදිය මුද්‍රා තැබූ මිල ගණන් කැඳවා විකිණීම පිණිස මඩකලපුව මහාධිකරණය විසින් ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම - 2017

වාලච්චේන දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය විසින් අත්පත් කර ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කනර ලද යතුරුපැදියක් සඳහා වන ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම යටතේ විකිණීමට තිබේ. මේ සඳහා වූ ඉල්ලුම් පත්‍ර 2017 පෙබරවාරි මස 21 වැනි දින ප. ව. 3.00 දක්වා භාරගනු ලැබේ.

සියලු ඉල්ලුම්පත්‍ර, මහාධිකරණ විනිසුරු, මහාධිකරණය, මඩකලපුව යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතු ය. එසේ නැතිනම් මහාධිකරණ ගිණුම් අංශයේ තැන්පත් කර ඇති ටෙන්ඩර් පෙට්ටියේ දැමිය යුතු ය. ඉල්ලුම්පත්‍ර යැවීමේ දී ලියුම් කවරයේ කවරයේ ඉහළ කොටසේ ''වාලච්චේන දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය විසින් රාජ්‍ය සන්තක කරන ලද වාහනය සඳහා ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

මහාධිකරණ මුද්‍රාව හා මහාධිකරණ ගණකාධිකාරිතැනගේ අත්සන සහිත ඉල්ලුම්පත්‍ර පමණක් පාවිච්චි කළ යුතු ය.

මෙලෙස ටෙන්ඩර් පත්‍රිකා මගින් විකිණීමට තීරණය කර ඇති වාහනයේ අයිතිය ඉල්ලන කවුරු හෝ සිටියි නම්, ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම අවසාන දින ප. ව. 3.00 ට පෙර ලේඛන සහිතව තමන්ගේ අයිතිය ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් පසුව ඒ සම්බන්ධයෙන් කිසිදු සැලකිල්ලක් නොදක්වන බවත් දන්වා සිටිමු.

ඒ සඳහා ආපසු නොගෙවනු ලබන රු. 100 ක් සමග පහත පරිදි තැන්පත් මුදල් තැන්පත් කළ යුතු ය. මෙම ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම 2017 පෙබරවාරි මස 20 වැනි දින ප. ව. 3.00 ට අවසන් වනු ඇත.

| *අනු. අංකය* | *වාහනයේ විස්තරය* | *වාහනයේ වර්ගය* | *නඩු අංකය* | *විකිණීම සඳහා ලබාදෙන ලද අංක* | *තැන්පත් මුදල රු. ශ.* |
|---|---|---|---|---|---|
| 1 | යතුරු පැදි 01 | Bajaj Pulsar BAR - 4407 | 30566 /F | MC/VCH/01/2017 | 1,000 0 |

වලංගු කාලය තුළ ලැබෙන මුද්‍රා සහිත සියලු ඉල්ලුම්පත්‍ර 2017 පෙබරවාරි මස 21 වැනි දින ප. ව. 3.00 ට පැමිණ සිටින ඉල්ලුම්කරුවන් ඉදිරිපිට, මහාධිකරණ සම්පාදන කමිටුව විසින් විවෘත කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා මගින් ඉහළ මිලක් සඳහන් කොට ඉල්ලුම්කර ඇති ඉල්ලුම්කරුවන්ට එම වාහනය විකිණීමට මඩකලපුව මහාධිකරණ සම්පාදන කමිටුව අනුමැතිය ලබාදෙයි. ඒ අනුව ඉදිරි විකිණීම් කටයුතු අදල අධිකරණය විසින් සිදුකරනු ලැබේ.

ටෙන්ඩර් කැඳවීම මගින් විකිණීමට තීරණය කර ඇති වාහනය කාර්යාල දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 2.30 දක්වා වූ කාලය තුළ අදළ වාලච්චේන දිසා/මහෙස්ත්‍රාත් අධිකරයේ රෙජිස්ට්‍රාර්ගේ අවසරය ඇතුව නිරීක්ෂණය කළ හැකි ය

විකිණීමට තීරණය කර ඇති වාහන සඳහා තක්සේරු මිල ලබාගෙන ඇති බැවින් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකාවල සඳහන් මිල තක්සේරු මිලට වඩා අඩුවෙන් පවතියි නම්, එම වාහන විකිණීම අත්හිටුවා දැමීමට ටෙන්ඩර් මණ්ඩලයට පූර්ණ බලය ඇත.

විකුණන ලද වාහන, මුදල් ගෙවා රිසිට් පත් ලබාගත් වහාම අධිකරණ භූමියෙන් ඉවත් කළ යුතු ය. එමෙන් ම සියලු ගෙවීම් මුදලින් සිදුකළ යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

ඉහත ටෙන්ඩර් මගින් සිදුකරන විකිණීම් පිළිබඳ අවසන් තීරණය ගැනීම මඩකලපුව මහාධිකරණ සම්පාදන කමිටුව සතු ය.

මහාධිකරණ විනිසුරු,
මහාධිකරණය,
මඩකලපුව.

01-960

# බඩු බාහිරාදිය විකිණීම්

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - වැල්ලවාය

### 2016.12.09 වැනි දින පළ කර තිබූ ප්‍රසිද්ධ වෙන්දේසියට අදාළ ගැසට් නිවේදනය අවලංගු කරන බව දැන්වීම

2016.12.10 වැනි දින මෙම අධිකරණයේ දී පැවැත්වීමට නියමිතව තිබූ ප්‍රසිද්ධ වෙන්දේසිය 2016.12.02 වැනි දින *ගැසට්* පත්‍රයේ පළ කිරීම සඳහා ඒවා තිබුණ ද ප්‍රමාද දෝෂයක් හේතුවෙන් එදින එය පළ නොවී 2016.12.09 වැනි දින *ගැසට්* පත්‍රයේ පළ කර ඇතත්, *ගැසට්* නිවේදනයේ පළ කර අවම වශයෙන් සතියක කාලයක් ඉක්ම යෑමෙන් අනතුරුව ප්‍රසිද්ධ වෙන්දේසියක් පැවැත්විය යුතු බැවින් 2016.12.10 වැනි දිනට නියමිත වෙන්දේසිය ගරු පූර්වගාමී විනිසුරුතුමන් විසින් අවලංගු කරන ලදී. එබැවින් 2016.12.09 වැනි දින *ගැසට්* පත්‍රයේ පළ කර තිබූ මෙම අධිකරණට අදළ ප්‍රසිද්ධ වෙන්දේසිය සම්බන්ධ *ගැසට්* නිවේදනය ද අවලංගු කරන බව මෙයින් දැනුම් දෙමි.

ගරු අධිකරණයේ අණ පරිදි,

රෙජිස්ට්‍රාර්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
වැල්ලවාය.

2017 ජනවාරි මස 10 වැනි දින,
වැල්ලවාය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

01-968

## දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - නිකවැරටිය

### අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ සහ මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවට අදළව ඉදිරිපත් කරනු ලැබූ හා රාජසන්තක කරන ලද මෙතෙක් හිමිකම් නොකියන ලද වෙන්දේසි කිරීමට නියෝග කරන ලද සහ කාර්යාලයෙන් ඉවත් කරන ලද පහත සඳහන් ද්‍රව්‍යයන් 2017.02.25 වැනි දින පෙරවරු 9.30 ට නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් වන කිසියම් ද්‍රව්‍යයක් පිළිබඳව හිමිකම් කියාපාන්නකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, වෙන්දේසියෙන් පසුව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි කිසිවක් භාරගනු නොලැබේ.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය භාගයකට පෙර වෙන්දේසි කිරීමට නියමිත ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවල අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිළ දී ගන්නා ද්‍රව්‍යයන් සඳහා එම අවස්ථාවේ දී ම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතු අතර, සියලුම ගෙවීම් මුදලින් කළයුතු අතර, චෙක්පත්/මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. වෙන්දේසියේ දී භාණ්ඩ මිළ දී ගන්නන් විසින් තම තමන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම පිණිස ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

ජී. එච්. කේ. එන්. සිල්වා,
දිසාවිනිසුරු/මහෙස්ත්‍රාත්,
නිකවැරටිය.

2017 ජනවාරි මස 10 වැනි දින,
නිකවැරටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2017.02.25 වැනි දින වෙන්දේසියට නියමිත භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 01. | අංක රහිත | හිස් වීදුරු බෝතල් තොගයක් | - |
| 02. | අංක රහිත | හිස් ප්ලාස්ටික් බූලි තොගයක් | - |
| 03. | අංක රහිත | තඹ දගර තොගයක් | - |
| 04. | අංක රහිත | සවල් | 20යි |
| 05. | අංක රහිත | විවිධ ප්‍රමාණයේ රවුම් කියත්තල | 20යි |
| 06. | අංක රහිත | උදළු | 06යි |
| 07. | අංක රහිත | ප්ලාස්ටික් බැරල් | 03යි |
| 08. | අංක රහිත | යකඩ බැරල් | 05යි |
| 09. | 30999 | බොරළු කියුබ් | 03යි |
| 10. | 31949 | බොරළු කියුබ් | 03යි |
| 11. | 31951 | බොරළු කියුබ් | 03යි |
| 12. | 16154 | කේබල් කම්බි | 03යි |
| | | අලවංගු | 02යි |
| | | උදළු | 01යි |
| | | කුළු ගෙඩි | 01යි |
| 13. | 16676 | චේන්ෂෝ කියත් | 01යි |
| 14. | 25960 | මන්නා පිහි | 01යි |
| | | කුළු ගෙඩි | 02යි |
| | | ගල් කටු | 01යි |
| | | අඬු | 01යි |
| | | ගයින්ඩර් | 01යි |
| 15. | 28877 | හිල්ටි වර්ගයේ ඩ්‍රිල් | 01යි |
| | | යකඩ මිටි | 01යි |
| | | කම්බි කුරු | 02යි |
| | | වයර් | 01යි |
| | | ටෙන්ට් රෙදි | 01යි |
| 16. | 26083 | 13.3 Kg ධාරිතාවය ලිට්රෝ ගෑස් සිලින්ඩර් | 01යි |
| | | රෙගුලේටර | 01යි |
| | | ගෑස් ලිප් | 01යි |
| 17. | 26142 | 12.4 Kg ධාරිතාවය ලිට්රෝ ගෑස් සිලින්ඩර් | 01යි |
| | | රෙගුලේටර | 01යි |
| | | ගෑස් ලිප් | 01යි |
| 18. | 30312 | 12.5 Kg ධාරිතාවය ලිට්රෝ ගෑස් සිලින්ඩර් | 01යි |
| | | ගෑස් ලිප් | 01යි |
| | | ඇළුමිනියම් මුට්ටි | 05යි |
| | | රබර් බට | 01යි |
| 19. | 31312 | 05 Kg ගෑස් සිලින්ඩර් | 01යි |
| | | රෙගුලේටර | 01යි |
| | | ගෑස් ලිප් | 01යි |
| 20. | | නිල රථයේ අබලි ටයර් | 04යි |
| 21. | 6496 | 146 - 1489 දරන යමහා යතුරු පැදි | 01යි |
| 22. | 10198 | NW JI 7081 දරන ලොන්සින් යතුරු පැදිය | 01යි |
| 23. | A887/14 | NWWP TO 8143 දරන හීරෝ හොණ්ඩා යතුරුපැදි | 01යි |
| 24. | 1139 | 140 - 5115 දරන හොණ්ඩා යතුරු පැදි | 01යි |
| 25. | A1166/13 | NWGN 9002 දරන Daido යතුරු පැදි | 01යි |
| 26. | A990/13 | එන්ජින් අංක CD 50 E 1603804 දරන යතුරුපැදි | 01යි |
| 27. | 17916 | NWGW 7659 දරන හොණ්ඩා යතුරුපැදි | 01යි |
| 28. | AR 712/15 | NWHY 3492 දරන බජාජ් යතුරු පැදි | 01යි |
| 29. | 5784 | එන්ජින් අංක 070 E 6847373 හොණ්ඩා යතුරුපැදි | 01යි |
| 30. | 15224 | 125 - 2629 දරන හොණ්ඩා යතුරු පැදි | 01යි |
| 31. | 6948 | NCHN 5316 දරන යතුරුපැදි | 01යි |
| 32. | 7819 | එන්ජින් අංක RV XXX 023 චැසි අංක 3 TY 023904 දරන යතුරු පැදි | 01යි |
| 33. | 24204 | NWJU 7875 දරන TVS යතුරු පැදි | 01යි |
| 34. | 4449 | චැසි අංක C 90-3129212 දරන යතුරු පැදි | 01යි |
| 35. | 14302 | NWTO 7507 දරන ලොන්සින් යතුරුපැදි | 01යි |
| 36. | 10648 | 131 - 8264 දරන හොණ්ඩා යතුරු පැදි | 01යි |
| 37. | 9359 | 89-5692 දරන හොණ්ඩා යතුරු පැදි | 01යි |
| 38. | 10836 | 95-5692 දරන හොණ්ඩා යතුරු පැදි | 01යි |
| 39. | 10968 | එන්ජින් අංක 07 F 22 E 11637 දරන යතුරුපැදි | 01යි |
| 40. | 10442 | එන්ජින් අංක 150 FMD දරන යතුරුපැදි | 01යි |
| 41. | B618/12 | B 160-6584 දරන හොණ්ඩා යතුරුපැදි | 01යි |
| 42. | 7556 | එන්ජින් අංක 5162856 ලෑන්ඩ් මාස්ටර් අත් ට්‍රැක්ටර් | 01යි |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය | ප්‍රමාණය |
|---|---|---|---|
| 43. | 9282 | වැසි අංක SX 104519 දරන සීපැන් අත්ට්‍රැක්ටර් | 01යි |
| 44. | 25119 | අංක අපැහැදිලි අත්ට්‍රැක්ටර | 01යි |
| 45. | 19790 | අංක අපැහැදිලි සීපැන් අත්ට්‍රැක්ටර | 01යි |
| 46. | 6619 | එන්ජින් අංක වැසි අංක අපැහැදිලි මැෂියු පර්ගියුෂන් ට්‍රැක්ටර් | 01යි |
| 47. | 9877 | වැසි අංක එන්ජින් අංක අපැහැදිලි අත්ට්‍රැක්ටර් | 01යි |
| 48. | 16032 | වැසි අංක එන්ජින් අංක අපැහැදිලි අත්ට්‍රැක්ටර් | 01යි |
| 49. | 14849 | 22- 0885 දරන මැෂියු පර්ගියුෂන් ට්‍රැක්ටර් | 01යි |

01-961

# රජයේ නොවන දැන්වීම්

## නිවේදනයයි

සී එෆ් සී ෆවුන්ඩිං (ගරන්ටි) ලිමිටඩ් 2016 දෙසැම්බර් මස 28 වැනි දින සංස්ථාපනය කරන ලද බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය ප්‍රකාර මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : සී එෆ් සී ෆවුන්ඩිං (ගරන්ටි) ලිමිටඩ්
සමාගමේ අංකය : ජී. එල්. 2414
ලියාපදිංචි කාර්යාලය : එල් 12/ඊටී/02, 12 වැනි මහල, නැගෙනහිර කුළුණ, ලෝක වෙළඳ මධ්‍යස්ථානය, කොළඹ 01

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එන්. ජේ. ඇන්ඩ් ජී ද සේරම්,
නීතිඥවරු.

01-782

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම පිළිබඳ නිවේදනයයි

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්, මහින්ද අභය ඇල්ලේපොල මහතා විසින් සහතික කරන ලද අංක 4023 සහ 1999 අප්‍රේල් මස 20 දින දරන ඇටෝර්නි බලපත්‍රයේ දීමනාකරු වන කොළඹ 02, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාර්ඩිනර් මාවතේ, අංක 117 දරන ලිපිනයේ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන, සමාගම් ලියාපදිංචි අංක 27 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ නීති යටතේ යථා පරිදි සංස්ථාගත කරන ලද සමාගමක් වන, රජවැල්ල හෝල්ඩින්ස් ලිමිටඩ් සමාගම විසින් එකී ඇටෝර්නි බලපත්‍රය, ඇටෝර්නි බලපත්‍ර ආඥා පනතේ (122 වන අධිකාරය) 4 වන වගන්තිය යටතේ වහාම අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ය කළ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

01-809

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2016 දෙසැම්බර් මස 16 වැනි දින සංස්ථාගත කරන ලදී.

නම : එඩ්ෆිනිටි එඩියුකේෂන් කන්සල්ටන්සි (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පී වී 118220
ලිපිනය : අංක 510/ඊ, කදුරුකැටිය පාර, ගෝනවෙල, කැලණිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සී එල් සී සෙක්‍රටේරියල් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,

ලේකම්වරු.

01-817

## ඇටෝර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ය කිරීම

වයඹ පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ටෙක්නිකල් පෙදෙසෙහි අංක 47 හි පදංචි (අංක 685812959 V දරන ජාතික හැඳුනුම්පත හිමි) හංගිලිගෙදර චන්ද්‍රාවතී වන මා විසින් ප්‍රසිද්ධ නොතාරිස් ඒ. ඒ. අබේවර්ධන විසින් සහතික කරන ලදුව වයඹ පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ටෙක්නිකල් පෙදෙසෙහි අංක 47 හි පදිංචි (අංක 732974326 V දරන ජාතික හැඳුනුම්පත හිමි කලංචි පේජ්ජලාගේ සිසිර කුමරතුංග වෙත ප්‍රදනය කරන ලද අංක 11808 සහ 2013 ජනවාරි මස 10 වැනි දින දරන විදේශ ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ය කර අවලංගු කරන බවත්, එකී ඇටෝර්නි බලපත්‍රය භාවිතා කරමින් එකී කලංචි පේජ්ජලාගේ සිසිර කුමාරතුංග විසින් සිදු කරනු ලබන කිසියම් ගනුදෙනුවක් සඳහා මා වගකීමක් නොදරන බවත්, පොදු මහජනතාව වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ.

හංගිලිගෙදර චන්ද්‍රාවතී.

01-823

## ප්‍රසිද්ධ දැන්වීමයි

2007 අංක 07 දරන පනත 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම 2016 දෙසැම්බර් මස 07 වැනි දින සංස්ථාගත කරන බවට කරනු ලබන දැන්වීම.

නම : ජන්ගල් ක්‍රීපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පී වී 118542
ලිපිනය : අංක 38/7, 5 වන පටුමග, වික්‍රමසිංහපුර, බත්තරමුල්ල.

01-826

---

## මහජනතාවට දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනත අනුව පහත සඳහන් සමාගම් පුද්ගලික සමාගම් ලියාපදිංචි සහතිකය ලබා සංස්ථාගත කරන ලද බව මෙයින් දැනුම් දෙමි.

සමාගම් නාමය : ග්ලෝබල් ඉන්ටර්ට්‍රේඩිං පාට්නර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
අංකය : පී වී 108297
සංස්ථාගත කළ දිනය : 2015.09.10
ලිපිනය : අංක 158, මැලිබන් පාර, කොළඹ 11.

01-832

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තියේ ප්‍රකාරව කරනු ලබන දැනුම් දීමයි.

සමාගම් නාමය : සයිනොසෙන් ඉන්ටර්නැෂනල් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 118818
ලියාපදිංචි ලිපිනය : අංක 7ඩී/ 143, ජයවඩනගම, බත්තරමුල්ල.

සඳුන් ගමගේ,
සමාගම් ලේකම්.

01-837

---

## නිවේදනයයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : සිඩ්නි සහ ඩේවිස් (පුද්ගලික) සමාගම
ලියාපදිංචි අංකය : පී වී 118897
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 76, එලී හවුස් පාර, කොළඹ 15
ලියාපදිංචි දිනය : 2016.12.22

සමාගමේ ලේකම්වරයා.

01-869

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(2) වගන්තිය යටතේ ඔෆ්සීස් කාර්ඩියැක් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගමේ නාමය ෆෝට්ස් ඔෆ්සීස් කාර්ඩියැක් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් වශයෙන් වෙනස් කර වර්ෂ 2011ක් වූ මාර්තු මස 11 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ කලින් නම : ඔෆ්සීස් කාර්ඩියැක් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 4170
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 18/ඒ, මුහන්දිරම් ඊ. ඩී. දබරේ මාවත, කොළඹ 05
සමාගමේ අලුත් නම : ෆෝට්ස් ඔෆ්සීස් කාර්ඩියැක් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ්

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව

චිත්‍රාල් අමරතුංග,
ලියාපදිංචි ලේකම්.

01-870

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ ජේ ලයින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2016ක් වූ දෙසැම්බර් මස 14 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ජේ ලයින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 118668
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : ''සිතාර'' තලගල දකුණ, ගෝනපල හංදිය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව

කෝ - සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

01-871

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ ෆියුෂන් ස්ට්‍රීට් (ප්‍රයිවට්) ලිමිටඩ් යන සමාගම සීමාසහිත පෞද්ගලික සමාගමක් වශයෙන් වර්ෂ 2016ක් වූ දෙසැම්බර් මස 07 වැනි දින ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : ෆියුෂන් ස්ට්‍රීට් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 118543
සමාගමේ ලියාපදිංචි කාර්යාලය : අංක 397, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 03.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිව ඇතුව,

කෝ - සර්ව් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලියාපදිංචි ලේකම්වරු.

01-872

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9(1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාපනය කර ඇති බැවින් මෙයින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ෆෙයාර්පිල් බ්‍රික් කම්පනි (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 117913
ලියාපදිංචි ලිපිනය : ඕර්කාඩ්ස් එස්ටේට්, පුස්සෙල්ලියාව, කෙම්බුරුඔියා, හන්තුන්ගමුව

සමාගමේ නම : ඉසුරු දෙහිගොල්ල මල්ටි විෂන් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 118094
ලියාපදිංචි ලිපිනය : අංක 654/ඒ, යාදිහාන, මල්වාන.

සමාගමේ නම : ඉසුරු දෙහිගොල්ල සෝලර් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 118236
ලියාපදිංචි ලිපිනය : අංක 654/ඒ, යාදිහාන, මල්වාන.

සමාගමේ නම : ඉසුරු දෙහිගොල්ල සෝලර් සිස්ටම් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 118114
ලියාපදිංචි ලිපිනය : අංක 654/ඒ, යාදිහාන, මල්වාන.

සමාගමේ නම : ඉසුරු දෙහිගොල්ල පවර් සිස්ටම් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 118093
ලියාපදිංචි ලිපිනය : අංක 654/ඒ, යාදිහාන, මල්වාන.

සමාගමේ නම : ට්‍රැවිකැල් ග්ලෝබල් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පී වී 116735
ලියාපදිංචි ලිපිනය : අංක 75/1, ටෙම්ප්ලර්ස් පාර, මවුන්ට් ලාවන්යා

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් ඩි සොලිෂියෝ (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

01-873

---

## ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමේ නිවේදනයයි

මොරිෂස් ජනරජයේ ප්‍රසිද්ධ නොතාරිස් ධර්මරාජ් පෙන්ටයියා විසින් 2011 නොවැම්බර් මස 22 වැනි දින සහතික කරන ලද බත්තරමුල්ල, නාගහමුල්ල පාරේ, අංක 41/28 ''ගිශාන්ත විජය රත්නායක'' යන අය වෙත ප්‍රදානය කරන ලද සහ 2011 දෙසැම්බර් මස 22 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට, අවලංගු කරන බවත්, ඒ අනුව, එකී ඇටෝර්නි බලපත්‍රය යටතේ මින්මතුවට කරන යම් කවරම වූ ගණුදෙණුවක් සඳහා අප වගකීමක් නොදරන බවත්, මොරිෂස් ජනරජයේ, ඉබින්, 19 සයිබර්සිටි, රැෆ්ල් ටවර්, 10 වන මහල යන ලිපිනයේ C/O DTOS LTD සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යන MGF Sourcing Mauritius Ltd සමාගමේ අධ්‍යක්ෂක වන ජිම් වොං වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයටත්, එහි මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

ජිම් වොං,
අධ්‍යක්ෂක.
MGF Sourcing Mauritius Ltd

01-874

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ගිෆ්ටබේ (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 119187
ලියාපදිංචි කළ දිනය : 2017 ජනවාරි 6
ලියාපදිංචි කාර්යාලය : අංක 12, රිඩ්ජ්වේ පෙදෙස, කොළඹ 04.

එස්. රාජකුලේන්ද්‍ර මිය,
නීතිඥ.

අංක 34/1, නෙල්සන් පෙදෙස,
වැල්ලවත්ත,
කොළඹ 06.

01-881

---

## දැන්වීමයි

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (1) වන වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : විස්ඩම් ග්‍රාමීන් ලිමිටඩ්
සමාගමේ අංකය : පී. බී. 5372
ලියාපදිංචි දිනය : 2017.01.04
ලියාපදිංචි ලිපිනය : අංක 7/1, කේම්බ්‍රිජ් පෙදෙස, කොළඹ 07.

ඩබ්. එස්. වීරමන්,
ලේකම්.

අංක 27/1, පැපිලියාන පාර,
නැදිමාල,
දෙහිවල.

01-916

**2007 අංක 7 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම**

සමාගමේ නම : සුපර් ක්‍රෙඩිට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 113496
ලියාපදිංචි ලිපිනය : 278/3, මහියංගන පාර, වෙලේතොට, තෙල්දෙණිය,

සමාගම් ලේකම්.

01-936

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 වැනි වගන්තියට අනුගාමීව සමාගමක් සංස්ථාපනය කිරීම පිළිබඳව මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : පියෝනියර් මැරින් ට්‍රේඩර්ස් (පීවීටී) එල්ටීඩී
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 115160
ලියාපදිංචි කාර්යාලය : අංක137/ඒ, කොරටුව පාර, කොටිකාවත්ත, අංගොඩ.
සංස්ථාපනය කිරීමේ දිනය : 2016 ජූලි 21

01-945

**දැන්වීමයි**

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : මිස්ට්හිල් රෙස්ට් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 118815
ලියාපදිංචි දිනය : 2016.12.23
ලියපදිංචි ලිපිනය : අංක 43/1ඒ, ධර්මලංකාර මාවත, දෙහිවල.

ලේකම්.

01-954

**දැන්වීමයි**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාර නිවේදනයයි.

නම : ජේ. එෆ් ඇන්ඩ් අයි කන්වර්ටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 117590
දිනය : 2016.11.01
ලිපිනය : අංක 321, කඩුවෙල පාර, කොස්වත්ත, තලංගම.

සමාගම් ලේකම්වරු.

01-958

**සීමාසහිත සමාගම් සංස්ථාගත කිරීම සඳහා දැන්වීම**

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

| *සමාගම් නම* | *සංස්ථාගත අංකය* | *ලියාපදිංචි ලිපිනය* |
|---|---|---|
| 1. රයිනා ටෙක්නිකල් සේවිස් (ප්‍රයිවට්) ලිමිටඩ් | පීවී 117284 | 505, මසූර් මෞලනා වීදිය, මරුදමුනයි |
| 2. කෙයා ලංකා එන්ටප්‍රයිසස් (පීවීටී) එල්ටීඩී | පීවී 96837 | 546/5, ගාලු පාර, කොළඹ 03 |
| 3. පෙයිනර් මෙරින් ට්‍රෙඩර්ස් (පීවීටී) එල්ටීඩී | පීවී 115160 | 1/ඒ/17, නීතිඥ සංකීර්ණය, ශා. සෙබස්තියන් හිල්, කොළඹ 12 |
| 4. වික්ටෙක් ඉන්ටනේෂනල් ගෘප් (පීවීටී) එල්ටීඩී | පීවී 110254 | 21/1, ලියනක්කා වීදිය, දෙහිවල. |

එම්. සී. එම් නවාස්,
සමාගම් ලේකම්.

01-840

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

## ඩී. එෆ්. සී. සී. බැංකුව පී. එල්. සී
(කලින් ඩී එෆ් සී සී බැංකුව ලෙස හැඳින්වූ)

1990 අංක 04 දරන බැංකු විසින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 8 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

**අංක 8134 දරන උකස්කරය යටතේ උකස් කරන ලද දේපළ පිළිබඳ විස්තර**

උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, අංක ජේ/197 දරන වලිකාමම් උතුර ග්‍රාම සේවා වසමේ, උඩුවිල් කෝරළේ චුන්නාකම් හි පිහිටි ''අක්කාලක්කල්ලඩි'' ලෙස හැඳින්වෙන වී. සී. ලවම් තුනක් (3 Lms V. C) සහ උතුරින් V. C ලවම් 6 1/2 න් 3 Kls වන නමුත් බලයලත් මිනින්දෝරු එම්. චිත්තම්පලම් විසින් සාදන ලද 2010 අගෝස්තු මස 12 වැනි දිනැති අංක 2731 දරන පිඹුරේ ලොට් අංක 01 ට අනුව V. C ලවම් තුනක් සහ කුලී අටයි දශම දෙකයි තුනයි (3 Lms V. C සහ 8.23 Kls) වන බිම් කොටස එහි පිහිටි ළිඳෙහි පංගුව සහ සියල්ල සහිතව.

යාපනය ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඉලන්ගෝවන් විසින් සහතික කරන ලද 2012 නොවැම්බර් මස 14 දිනැති අංක 8134 දරන උකස්කරය ප්‍රකාර, නැගෙනහිර චුන්නාකම්, චුන්නාකම් හි පදිංචි වේළුපිල්ලෙයි ශ්‍රී ස්කන්ධරාජා සහ ශ්‍රී ස්කන්ධරාජා රාජකලා යන අය විසින් ඩී එෆ් සී සී බැංකුව පී එල් සී ට උකස් කරන ලදුව, ගෙවීම්වල දී පොරොන්දු නිසියාකාරව ඉෂ්ඨ නොකරන ලද දේපළ ඩී එෆ් සී සී බැංකුව පී එල් සී විසින් අප වෙත පවරන ලද බලය යටතේ අප විසින් 2017 පෙබරවාරි මස 14 වැනි දින (අඟහරුවාද) පෙ. ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*ගෙවීමේ ක්‍රමය.* - මිල තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% ක් (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල 2 1/2% (සියයට දෙකහමාර),
4. රු. 147,000.00 ක් වන සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000.

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පණවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අය බදු හෝ ගාස්තු අය කිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

වැඩි විස්තර සඳහා කරුණාකර ඩී එෆ් සී සී බැංකුව පී එල් සී හි නීති දෙපාර්තමේන්තුව අමතන්න. දුරකථන අංක 011- 2371371.

''ඉහත වෙන්දේසිය පෙර දැනුම්දීමකින් තොරව නවතා ගැනීමේ/අවලංගු කිරීමේ පූර්ණ අයිතිය බැංකුව සතුයි.''

ශොක්මන් සහ සමරවික්‍රම,
එකම රටක්, එකම වෙන්දේසිකරුවෙක්,
වසර 125 ක සේවා විශිෂ්ටත්වය සමගින්.

*ප්‍රධාන කාර්යාලය :*
අංක 24, ටොරින්ටන් පාර,
මහනුවර.
දුරකථන අංකය : 081 - 2227593
දුරකථන/ෆැක්ස් අංකය : 081-2224371
ඊමේල් : schokmankandy@sltnet.lk

*නගර කාර්යාලය හා ප්‍රදර්ශනාගාරය :*
අංක 290, හැව්ලොක් පාර,
කොළඹ 05
දුරකථන අංක : 011-2502680, 2585408
දුරකථන/ෆැක්ස් අංකය : 011- 2588176
ඊමේල් : schokman@samera1892.com

වෙබ් අඩවිය : www.sandslanka.com

01-815

---

## නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී- ගම්පොළ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පදිංචියට සුදුසු දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගම්පොළ - නාවලපිටිය ප්‍රධාන මාර්ගයට ඉතා නුදුරුව සිංහපුර ඇත්ගාල ගමේ පිහිටි මරියවත්ත එස්ටේට් නමැති ඉඩමට බලයලත් මානක ඩී එම් පී බී රඹුක්වැල්ල විසින් 2013.09.28 වැනි දින අංක 4218 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් ඒ නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි ගහකොළ වගාව ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 27.17

මෙම දේපළ ගම්පොළ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන ''අරවින්ද වෙළඳ සමාගම'' යන නාමය විලාසය හා ව්‍යාපාරය යටතේ හවුල් ව්‍යාපාර කටයුතුවල යෙදෙන මුදුන්කොටුවේගෙදර ටිෂාන් එරංග ගුණතිලක, මුදුන්කොටුවේගෙදර

සුසිල් ප්‍රේමපුෂ්ප ගුණතිලක සහ රත්නායක මුදියන්සේලාගේ නන්ද ගුණතිලක ණයකරුවන් වශයෙන් නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම*.- ගම්පොල නගරයේ සිට නාවලපිටිය මාර්ගයේ කිලෝමීටර් 4.8ක් පමණ ඇත්ගාල හන්දිය දක්වා පැමිණ වමට හැරී (උප තැපැල් කාර්යාලය අසලින්) බංගලාව පාරට පිවිස මීටර් 15ක් පමණ ගමන් ගෙන නැවත වමට හැරී දුන්හිඳ පාරට ඇතුළු වී මීටර් 800ක් පමණ ගමන් ගත් විට මෙම පාරේ දකුණු පසින් පාරට මායිම්ව පිහිටා තිබේ.

2017ක් වූ පෙබරවාරි මස 15 වැනි දින පෙ. ව. 10.00 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.12.16 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2016.12.02 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකුරල් පුවත්පත් බලන්න. එමෙන් ම විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.01.27 දින රජයේ *ගැසට් පත්‍රය* බලන්න.

*ගෙවීමේ ක්‍රමය*. - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු, තීරු බදු අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. කළමණාකරු මධ්‍යගත (ණය අයකිරීම්) නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. අංක 40, නවම් මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011- 2448448.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර.
දුරකතන අංක : 071-4755974/071-8446374/077-7761706/
දුරකතන /ෆැක්ස් අංකය : 081- 2210595.

01-939

## නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. - ගම්පොළ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

ගම්පොළ නගර සභා සීමාවන් තුළ වෙළඳ කලාපය තුළ ගම්පොළ දුම්රියපොළ පාරේ පිහිටි ඉඩමට බලයලත් මානක පී. ආර්.එන්. ශ්‍යාමලී රත්නායක විසින් 2013.06.08 වැනි දින සාදන ලද අංක 1112 දරන පිඹුරේ නිරූපිත බෙදා වෙන් කරන ලද ලොට් 01 නමැති ඉඩම් කොටස හා එහි තුළ පිහිටි සත් මහල් ව්‍යාපාරික ගොඩනැගිල්ල ඇතුළු සියලු දේ. ඉඩමේ ප්‍රමාණය පර්චස් 1.85.

(ඉහත දේපළ බැංකුව සඳහා වූ සියළු බදු අයිතිවාසිකම් හිමිකම් හා බලපුළුවන්කාරකම්වලට යටත්ව විකුණනු ලැබේ.)

මෙම දේපළ ගම්පොළ සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන ''අරවින්ද වෙළඳ සමාගම'' යන නාමය විලාසය හා ව්‍යාපාරය යටතේ හවුල් ව්‍යාපාර කටයුතුවල යෙදෙන මුදුන්කොටුවේගෙදර ටිෂාන් එරංග ගුණතිලක, මුදුන්කොටුවේගෙදර සුසිල් ප්‍රේමපුෂ්ප ගුණතිලක සහ රත්නායක මුදියන්සේලාගේ නන්දා ගුණතිලක ණයකරුවන් වශයෙන් නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

*දේපළට පිවිසීම*.- ගම්පොළ නගර මධ්‍යයේ සිට දුම්රියපොළ පාරේ (නාවලපිටිය පාර) මීටර් 500ක් පමණ ගමන් ගත් විට අදළ දේපළ මාර්ගයේ වම් පසින් පාරට මායිම්ව පිහිටා තිබේ. (ගම්පොළ දුම්රිය ස්ථානයට ඉදිරිපසින්)

2017ක් වූ පෙබරවාරි මස 15 වැනි දින පෙ. ව. 10.45 ට එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.12.16 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2016.12.02 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකුරල් පුවත්පත් බලන්න. එමෙන් ම විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.01.27 දින රජයේ *ගැසට් පත්‍රය* බලන්න.

*ගෙවීමේ ක්‍රමය*. - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත්

ව්‍යවස්ථාපිත බදු, තීරු බදු, අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවාද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. කළමණාකරු මධ්‍යගත (ණය අයකිරීම්) නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. අංක 40, නවම් මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011- 2448448.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත, ලේවැල්ල පාර, මාවිල්මඩ, මහනුවර.
දුරකතන අංක : 071-4755974/071-8446374/077-7761706/
දුරකතන /ෆැක්ස් අංකය : 081- 2210595.

01-938

---

## නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී- ගම්පොළ ශාඛාව

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යෝජනා සම්මත කරගත් පරිදි මා වෙත පවරා ඇති බලතල ප්‍රකාරව පහත විස්තර වන දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම.

*දේපළ විස්තරය :*

ගම්පොල අඹගමුව පාරේ අංක 230 සහ ගම්පොල දුම්රිය පොළ පාරේ අංක 47 දරන ස්ථානයේ පිහිටා ඇති ස්ටෝර්ස් තුළ තබා ඇති හෝ ගබඩා කර ඇති ප්‍රීමා තිරිඟු පිටි තොග සහ වෙනත් වියළි ද්‍රව්‍ය ග්‍රොසරි සහ සිල්ලර උපකරණ හා සෑම හා සියලු තොග වෙළෙඳ තොග, වෙළෙඳ භාණ්ඩ නිමි භාණ්ඩ සහ අනෙකුත් චංචල දේපළ ණයට ගන්නන් විසින් කළින් කලට ගෙන එනු ලබන හෝ ඉහත පරිශ්‍රයන් මත ගබඩා කර ඇති හෝ තබා ඇති සෑම වෙළෙඳ තොග හා ණයට ගන්නන් විසින් වෙළෙඳ කටයුතු සඳහා පවත්වාගෙන යනු ලබන වෙනත් ස්ථානයක සවිකර ඇති, තබා ඇති ගබඩාකර ඇති වෙළෙඳ තොග ඇතුළු අනෙකුත් සියලු දේ.

මෙම දේපළ ගම්පොල සිය ලියාපදිංචි කාර්යාලය පවත්වාගෙන යනු ලබන ''අරවින්ද වෙළෙඳ සමාගම'' යන නාමය විලාසය හා ව්‍යාපාරය යටතේ හවුල් ව්‍යාපාර කටයුතුවල යෙදෙන මුදුන්කොටුවේගෙදර ටිෂාන් එරංග ගුණතිලක, මුදුන්කොටුවේගෙදර සුසිල් ප්‍රේමපුෂ්ප ගුණතිලක සහ රත්නායක මුදියන්සේලාගේ නන්ද ගුණතිලක ණයකරුවන් වශයෙන් නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සි. වෙතින් ලබාගන්නා ලද ණය පහසුකම් වෙනුවෙන් බැංකුවට සුරක්ෂිත කර ඇත.

2017ක් වූ පෙබරවාරි මස 15 වැනි දින

*1 වැනි විකිණීම* - පෙ. ව. 11.00 ට ගම්පොල දුම්රියපොළ පාර අංක 47 පිහිටි පරිශ්‍රයේ දී ද,

*2 වැනි විකිණීම* - පෙ. ව. 11.30 ට ගම්පොළ අඹගමුව පාර අංක 230 පිහිටි පරිශ්‍රයේ දී ද මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය සඳහා 2016.12.16 වැනි දින රජයේ *ගැසට් පත්‍රයේ* ද, 2016.12.02 වැනි දින දිවයින, ද අයිලන්ඩ් හා තිනකුරල් පුවත්පත් බලන්න. එමෙන් ම විකිණීම පිළිබඳ දැන්වීම සඳහා 2017.01.27 දින රජයේ *ගැසට් පත්‍රය* බලන්න.

*ගෙවීමේ ක්‍රමය.* - මිළ තීන්දු වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුළු මුදල් මුදලින් ගෙවිය යුතු ය.

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1% ක (සියයට එකක) විකුණුම් බදු,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. සම්පූර්ණ ප්‍රචාරක පිරිවැය,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 500,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තුව රු. 2,000,

ගැණුම් මිලෙන් 90%ක් වූ ඉතිරිය ද, ශ්‍රී ලංකා ආණ්ඩුව විසින් හෝ වෙනත් අධිකාරියක් විසින් හෝ පනවනු ලබන වෙනත් ව්‍යවස්ථාපිත බදු තීරු බදු අයබදු හෝ ගාස්තු අයකිරීම් ද වෙතොත් ඒවා ද සමග වෙන්දේසි දින සිට දින 30ක් ඇතුළත ගෙවිය යුතු වේ.

හිමිකම් ඔප්පු සහ වැඩි විස්තර සඳහා විමසන්න. කළමණාකරු මධ්‍යගත (ණය අයකිරීම්) නැෂනල් ඩිවෙලොප්මන්ට් බැන්ක් පී. එල්. සී. අංක 40, නවම් මාවත, කොළඹ 02.

දුරකථන අංක : 011- 2448448.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
අධිකරණ හා වාණිජ බැංකු පිළිගත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
ලේවැල්ල පාර,
මාවිල්මඩ, මහනුවර.

01-937

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397අධිකාරය) 22 වැනි වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය යොමු අංකය : 76510643/838798

බෝයගනේ, මල්පිටිය, කොළඹ පාරේ අංක 37 හි පදිංචි හිටිබණ්ඩාර අතපත්තු මුදියන්සේලාගේ ආනන්ද පරාක්‍රම කුමාර අල්ගම මහතාට අයත් උකස්කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016.12.16 දිනැති අංක 1998 දරන *ගැසට් පත්‍රයේ* හා 2016.12.08 දිනැති ''දිනමිණ'' හා 2016.12.08 ''ඩේලිනිව්ස් හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකරගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2017.02.23 වැනි දින 1 වන දේපළ පෙ. ව. 10.00 ට සහ 2 වන දේපළ ප.ව. 1.00 ට ද, 3 වන දේපළ ප. ව. 3.00 ට ද කුරුණෑගල මල්කඩුවාව, තල්ගොඩපිටිය මාවත, අංක 33 හි පදිංචි වෙන්දේසිකාර ඒ. ඩබ්. අශෝක ජයලාල් මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

#### පළමු උපලේඛනය

1. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තිරගන්දාහෙ කෝරළේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවේ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මඩිතියවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ ඔලුපැලියාවේ පිහිටි "හිටිනවත්ත හෙවත් හෙවනවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. එස්. ගලගෙදර විසින් සාදන ලද 2007.08.26 දිනැති අංක 8428 දරන පිඹුරෙහි ලොට් 02 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් අංක 2 එකී පිඹුරට අනුව උතුරට : එම්. රණසිංහට සහ වෙනත් අයට අයිති කුඹුර හා ඉඩම ද, නැගෙනහිරට : අංක 5846 දරන පිඹුරෙහි ලොට් 6 ද, දකුණට : අඩි 20 පළල පාරක් වන (කොළඹ - කුරුණෑගල ප්‍රධාන පාරට දිවෙන) අංක 5846 දරන පිඹුරෙහි ලොට් 5 ද, බස්නාහිරට : අංක 5846 දරන පිඹුරෙහි ලොට් 1 හා 2 ද, වයඹට : එකී අංක 8428 දරන පිඹුරෙහි ලොට් 1 ද මායිම්ව පර්චස් විසි අටක (අ. 0, රූ. 0, පර්. 28) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙයට අංක 5846 දරන පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා ඇති පාර භාවිතා කිරීමට ද අයිතිය ඇත. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 1681/164 හි ලියාපදිංචි කර ඇත.

එකී ඉඩම පහත (අ), (ආ) සහ (ඇ) හි විසිතර කර ඇති ඉඩම්වල ඒකාබද්ධ කිරීමක් හා නැවත මැනීමකි.

(*අ*) එකී ඔලුපැලියාවෙහි පිහිටි "හිටිනවත්ත හෙවත් හෙවනවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ටී ගුණසේකර විසින් සාදන ලද 1997.07.20 දිනැති අංක 5846 දරන පිඹුරෙහි ලොට් 3 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3 එකී පිඹුරට අනුව උතුරට : එම්. රණසිංහගේ කුඹුර ද, නැගෙනහිරට : එකී පිඹුරෙහි ලොට් 4 Aද, දකුණට : එකී පිඹුරෙහි අඩි 20 පළල පාරක් වන ලොට් 5 ද, බස්නාහිරට: ලොට් 1 සහ 2 ද, වයඹට : එම්. රණසිංහගේ ඉඩම ද, මායිම්ව එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ඇතුළත්ව පර්චස් දහහතර, (අ. 0, රූ. 0, පර්. 14) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, අංක 5846 දරන පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා නිරූපණය කර ඇති පාර භාවිතා කිරීමේ අයිතිය ද ඇත.

මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 1297/244 හි ලියාපදිංචි කර ඇත.

(*ආ*) එකී ඔලුපැලියාව පිහිටි "හිටිනවත්ත හෙවත් හෙවනවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ටී. ගුණසේකර විසින් සාදන ලද 1997.07.20 දිනැති අංක 5846 දරන පිඹුරෙහි ලොට් 4 A ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 4A එකී පිඹුරට අනුව උතුරට : එම්. රණසිංහ හා වෙනත් අයට අයිති කුඹුර ද, නැගෙනහිරට : එකී පිඹුරෙහි ලොට් 4 B ද, දකුණට : එකී පිඹුරෙහි අඩි 20 පළල පාරක් වන ලොට් 5 ද, බස්නාහිරට : එකී පිඹුරෙහි ලොට් 3 ද මායිම්ව එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ඇතුළත්ව පර්චස් හතක (අ. 0, රූ. 0, පර්. 7) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, අංක 5846 දරන පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා නිරූපණය කර ඇති පාර භාවිතයට සහ නඩත්තු කිරීමේ අයිතිය ද සහිතය. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 1528/163 හි ලියාපදිංචි කර ඇත.

(*ඇ*) එකී ඔලුපැලියාව පිහිටි "හිටිනවත්ත හෙවත් හෙවනවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. ටී. ගුණසේකර විසින් සාදන ලද 1997.07.20 දිනැති අංක 5846 දරන පිඹුරෙහි ලොට් 4 B ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 4 B එකී පිඹුරට අනුව උතුරට : එම්. රණසිංහ හා වෙනත් අයට අයිති කුඹුර ද, නැගෙනහිරට : එකී පිඹුරෙහි ලොට් 6 ද, දකුණට : එකී පිඹුරෙහි අඩි 20 පළල පාරක් වන ලොට් 5

ද, බස්නාහිරට : එකී පිඹුරෙහි ලොට් 4 A ද මායිම්ව එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ඇතුළත්ව පර්චස් හතක (අ. 0, රූ. 0, පර්. 7) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර අංක 5846 දරන පිඹුරෙහි ලොට් 5 ලෙස දක්වා නිරූපණය කර ඇති පාර භාවිතයට සහ නඩත්තු කිරීමේ අයිතිය ද ඇතුළත්ය. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 1559/131 හි ලියාපදිංචි කර ඇත.

2. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තිරගන්දහයේ කෝරළේ, වැඋඩ විල්ලි හත්පත්තුවේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, තුළ මඩිතියවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ බෝයගනේ පිහිටි "මැද අමුණ" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. බී. එම්. වෙබර් විසින් සාදන ලද 1985.10.27 දිනැති අංක 1018 දරන පිඹුරෙහි ලොට් 2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 2 එකී පිඹුරට අනුව උතුරට : ඇල සහ එකී පිඹුරෙහි ලොට් 1 ද, නැගෙනහිරට : එකී පිඹුරෙහි ලොට් 1 ද, දකුණට : තිලකරත්න උරුමකම් කියන ඉඩම ද, බස්නාහිරට : කොළඹ සිට කුරුණෑගල දක්වා දිවෙන ප්‍රධාන පාර ද මායිම්ව එහි ඇති වෙනත් සියලු දේ සමග පර්චස් විසිතුනක (අ. 0, රූ. 0, පර්. 23) බිම් ප්‍රමාණයකින් යුක්ත වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 1091/196 හි ලියාපදිංචි කර A 1681/165 වෙත ගෙන ගොස් ඇත.

එම ඉඩම මෑතක දී කරන ලද නැවත මැනීමකට අනුව එකී බෝයගනේ පිහිටි "මැද අමුණ" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජී. ඩබ්. ඩී. එස්. ගුණරත්න විසින් සාදන ලද 1998.07.11 දිනැති අංක 78/98 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස නිරූපණය කර ඇති අතර එකී ලොට් 2 එකී පිඹුරට අනුව උතුරට : මහේන්ද්‍ර රණසිංහ උරුමකම් කියන කුඹුර ද, නැගෙනහිරට : මහේන්ද්‍ර රණසිංහ උරුමකම් කියන කුඹුර ද, දනට තිලකරත්න උරුමකම් කියන විකුණූ ඉඩම ද, දකුණට : තිලකරත්න උරුමකම් කියන විකුණූ ඉඩම ද, බස්නාහිරට : කොළඹ සිට කුරුණෑගල දක්වා දිවෙන පාර ද මායිම්ව පර්චස් විසිතුනක (අ. 0, රූ. 0, පර්. 23) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති වෙනත් සියලු දේ ද වේ.

ඔලුපැලියාව පිහිටි බලයලත් මිනින්දෝරු ජී. එස්. ගලගෙදර විසින් සාදන ලද 2007.08.26 දිනැති අංක 8428 දරන පිඹුරේ ලොට් 1 ලෙස දක්වා ඇති එකී ඉඩම උතුරට : මහේන්ද්‍ර රණසිංහ උරුමකම් කියන කුඹුර නැගෙනහිරට : මහේන්ද්‍ර රණසිංහ සහ වෙනත් අය උරුමකම් කියන කුඹුර ද, දකුණට : අංක 5846 දරන පිඹුරෙහි ලොට් 1 ද, බස්නාහිරට : කොළඹ සිට කුරුණෑගල දක්වා දිවෙන ප්‍රධාන පාර ද ගිණිකොණට : එකී අංක 8428 දරන පිඹුරෙහි ලොට් 2 ද මායිම්ව පර්චස් විසිතුනක (අ. 0, රූ. 0, පර්. 23) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

3. වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තිරගන්දහයේ කෝරළේ, වැඋඩවිල්ලිහත්පත්තුවේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවේ, කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, මඩිතියවල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ඔලුපැලියාව ග්‍රාමයේ පිහිටි "කනුකැටියෙ කුඹුර දැන් වත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. බී. දිසානායක විසින් සාදන ලද 1993.06.26 දිනැති අංක 1013 A දරන පිඹුරෙහි ලොට් 8 ලෙස සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 8 උතුරට : එම පිඹුරේම ලොට් 2 ද, නැගෙනහිරට : එම පිඹුරේ ලොට් 3 (ප්‍රවේශ මාර්ගය) සහ ලොට් 7 ද, දකුණට සහ බස්නාහිරට : ඩී. ආර්. එල්. තිලකරත්නගේ ඉඩම ද මායිම්ව පර්චස් විසිනවය ද (අ. 0, රූ. 0, පර්. 29) එහි ඇති ගහකොළ, වගාවන් සහ වෙනත් සියලු දේ ද සමග වේ. මේ සමග මෙයට එකී අංක 1013 A දරන පිඹුරෙහි ලොට් 3 (පාරට වෙන් කළ කොටස) සහ ලොට් 4 (අඩි 3ක් පළල ඇල) හි අයිතිය ද ඇත. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ A 1303/134 හි ලියාපදිංචි කර A 1681/166 වෙත ගෙන ගොස් ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එච්. ඒ. කේ. සම්පත්,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු.

ලංකා බැංකුව,
දෙවන නගර අධිශ්‍රේණි ශාඛාව,
කුරුණෑගල.

01-877

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

(1) ණය යොමු අංකය : 73195558.

අඹන්පොල, කිවුලේගම, අනුරාධපුර පාර, අංක 280/1 හි පදිංචි දිසානායක මුදියන්සේලාගේ ප්‍රීතිකා ලක්මිණි දිසානායක මියට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016.04.22 දිනැති අංක 1964 දරන ගැසට් පත්‍රයේ හා 2016.04.19 වැනි දින ''ඩේලිනිව්ස් , දිනමිණ හා තිනකරන් යන පුවත්පත වල පළ කරන ලද ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනා සම්මුතියකට අනුකූලව මුල් ණය මුදලේ ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක්, ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ

අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර එකී ස්ථානයේ දී ම 2017.02.22 වැනි දින පෙ. ව. 11.00 ට කුරුණෑගල මල්කඩුවාව, තල්ගොඩපිටිය මාවත, අංක 33 හි පදිංචි වෙන්දේසිකාර ඒ. ඩබ්. අශෝක ජයලාල් මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල, දිස්ත්‍රික්කයේ, වන්නිහත්පත්තුවේ, ගන්තිහ කෝරළේ මහව ප්‍රාදේශීය සභා සීමාවේ අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 191 දරන උඩංගාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ කිවුලේගම ග්‍රාමයෙහි පිහිටි ''සියඹලාගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. ඒ. වී. රාජනායගම් විසින් සාදන ලද 2006 ඔක්තෝබර් 28 දිනැති අංක 371/06 දරන පිඹුරෙහි ලොට් 01 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට 1 උතුරට කුකුලෑව සිට මහපාර දක්වා දිවෙන ප්‍රාදේශීය සභා පාර ද, නැගෙනහිරට : අනුරාධපුරයෙහි සිට කුරුණෑගල දක්වා දිවෙන ප්‍රධාන පාරද, දකුණට : ඩී. එම්. ගුණපාලගේ ඉඩම ද, බස්නාහිරට : නන්දාවතීගේ ඉඩම ද, මායිම්ව රූඩ් දෙකයි පර්චස් තිස්අටයි දශම හයයි බිංදුවක (අ. 0 රූ. 2 පර්. 38.60) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි ගහකොළ ආදී සියලු දේ සමග වේ.

එකී ලොට් 01 පහත විස්තර කර ඇති ඉඩමෙහි නැවත මැනීමකි.

එකී කිවුලේගම පිහිටි අංක 3178 දරන FVP පිඹුරෙහි නිරූපිත සීමා නිර්ණය කොට ඇති රජයේ බෙදූ ඉඩම් කොටස උතුරට : කිවුලේගම පාරද, නැගෙනහිරට : අනුරාධපුර දක්වා දිවෙන පාර ද, දකුණට : සුනීතා ලක්මාලිට දූනට ප්‍රීතිකා ලක්මිණිට අයත් ඉඩම ද, බස්නාහිරට : නන්දාවතීගේ ඉඩම ද, මායිම්ව හෙක්ටයාර් බිංදුවයි දශම තුනයි බිංදුවයි බිංදුවක (හෙක්ටයාර් 0.300) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති සියලු දේ සමග වේ. මෙය නිකවැරටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ නික/මහ/33/108හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඩබ්. එම්. ආර්. වීරසිංහ,
කළමනාකරු.

ලංකා බැංකුව,
ගල්ගමුව.

01-878

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 22 වගන්තිය යටතේ විකිණීම පිළිබඳ දැන්වීම

ණය යොමු අංක : 71896755 සහ 75927952
නිට්ටඹුව, නඹදලුව, අංක 570 සී හි අතපත්තු මුදියන්සේලාගේ මහින්ද අතපත්තු යන අයට අයත් උකස් කරන ලද දේපළ විකිණීම.

ලංකා බැංකු ආඥාපනතේ 19 වැනි වගන්තිය යටතේ ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරනු ලැබ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2016.10.21 දිනැති අංක 1990 දරන ගැසට් පත්‍රයේ හා 2016.10.13 දින ''දිනමිණ'', ''ඩේලිනිව්ස්'' හා ''තිනකරන්'' යන පුවත්පත්වල පළ කරන ලද නිවේදනවලට අනුකූලව මුල් ණය මුදල්වල ශේෂය ද, විකිණීම කෙරෙන දිනය තෙක් ඒ මත අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥාපනතේ අංක 26 වන වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල් ද අයකර ගැනීම පිණිස මෙහි පහත උපලේඛනයේ විස්තර කොට ඇති දේපළ සහ පරිශ්‍ර පිහිටි ස්ථානයේ දී ම 2017.02.15 වැනි දින පෙ. ව. 10.30 ට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි ටී ඇන්ඩ් එච් ඔක්ෂන් හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දන්වා සිටිමු.

උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, උඩුගහ පත්තුවේ, අංක 348/ජී දරන නැගෙනහිර නඹදලුව ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ අත්තනගල්ල ප්‍රාදේශීය සභා සීමාව තුළ නිට්ටඹුව උපකාර්යාලයේ නඹදලුව ග්‍රාමයෙහි පිහිටි ''තැඹිලිහේන හෙවත් තැඹිලිකොටුව'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඒ. රණසිංහ විසින් සාදන ලද 1989 ඔක්තෝබර් මස 2 දිනැති අංක 2075 දරන පිඹුරෙහි ලොට් බී ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් බී ඊසාන දිගට ලොට් 15 (අඩි 15 පළල පාර) සහ කලින් එස්. ඩී. බංඩාරනායකට අයිතිව තිබූ දූනට ඊ. ඇක්මන් සහ වෙනත් අයට අයිති ඉඩම ද, ගිනිකොණට කන්දෙහේන ද නිරිතට : එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායකගේ උරුමකරුවන්ට අයත් හොරගොල්ල එස්ටේට් ද වයඹට ලොට් ඒ ද, මායිම්ව එකී අංක 2075 දරන පිඹුරට අනුව පර්චස් විසිහතක (අ. 0 රූ. 0 පර්. 27) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ. මෙය ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එෆ් 377/196 හි ලියාපදිංචි කර ඇත.

ලොට් බී ලෙස දක්වා ඇති එකී ඉඩම් කැබැල්ල බලයලත් මිනින්දෝරු පී. එන්. ජයසුන්දර විසින් මෑතකදී මැන සාදන ලද 2001 දෙසැම්බර් මස 01 දිනැති අංක 1943 දරන මිනුම් පිඹුරට අනුව පහත සඳහන් ආකාරයට විස්තර කර ඇත.

එකී නඹදලුව ග්‍රාමයෙහි පිහිටි ''තැඹිලිකොටුව'' නමැති ඉඩමෙහි අංක 1943 දරන පිඹුරෙහි ලොට් බී ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් බී ඊසාන දිගට කලින් ශ්‍රීමත් එස්. ඩී. බංඩාරනායකට අයිති දූනට එම්. ඇක්මන් සහ වෙනත් අයට අයිති ඉඩම ද, ගිනිකොණට කන්දෙහේන ද නිරිතට ඃ එස්. ඩබ්. ආර්. ඩී. බංඩාරනායකගේ උරුමකරුවන්ට අයත් හොරගොල්ල එස්ටේට් ද වයඹට ඃ ලොට් ඒ සහ පාරට වෙන් කළ කොටස ද, මායිම්ව එකී අංක 1943 දරන පිඹුරට අනුව පර්චස් විසිහතක (අ. 0 රූ. 0 පර්. 27) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගහකොළ, වගාවන් , ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. පී. ආර්. එම්. ප්‍රියංකර,
කළමනාකරු.

ලංකා බැංකුව,
නිට්ටඹුව ශාඛාව.

01-966

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.